

# ශුද්ධවූ ජපමාලය
# HOLY ROSARY



## ත්‍රිත්ව ස්තෝත්‍රය

පිතා පුත්‍රයා ස්ප්‍රිතු සාන්තු නම් ත්‍රිත්ව ඒක දේවෝත්තමයාණන් වහන්සේට ස්තෝත්‍ර වේවා.
ආදි වූවාක් මෙන් දැනුත් නිතිපතත් අනන්ත කාලයෙහිත් වේවා. ආමෙන්.

## ස්වාමිවාක් ආරාධනාව

ස්වර්ගයේ වැඩ සිටින අපගේ පියාණෙනි, ඔබවහන්සේගේ ශ්‍රී නාමයට ප්‍රශංසා වේවා.
ඔබ වහන්සේගේ රාජ්‍යය පැමිණේවා. ඔබ වහන්සේගේ කැමැත්ත ස්වර්ගයෙහි මෙන්
මෙලොවෙහිද ඉටු වේවා. අපගේ එදිනෙදා භෝජනය අද අපට දානය කළ මැනව.
අපට වරද කරන අයගේ වැරදි අප කමාකරන්නාක් මෙන් අපගේ වැරදිද කමා කළ මැනව.
පාප අවස්ථාවන්ට අසුවීමට අපට ඉඩ නොදී අයහපතින් අප මුදා ගත මැනව.

## දේවදූත මංගලම්

නමෝ මරියනී, ප්‍රිය ප්‍රසාද පූර්ණාවන්තිනී, ස්වාමී වහන්සේ නුඹ කෙරෙහිය.
ස්ත්‍රීන් අතුරෙන් ආශිර්වාද ලද්දී ඔබ වහන්සේය. ඔබගේ ශ්‍රී කුසෙහි ඵලවන්
ජේසුස් ආශිර්වාද ලද්දාහුමය. සාන්ත මරියනී, දේව මෑණියනී, පාපි වූ අප උදෙසා
දැනුත්, අපේ මරණ වේලෙහිත් යච්කදා කළ මැනව. ආමෙන්

## විශ්වාස ලක්‍ෂණය

අහස පොළොව මැවූ සර්වබලාධාරි වූ පිතාවන දෙවියන් වහන්සේ කෙරෙහිද ඔහුගේ ඒක පුත්‍ර වූ
අපගේ ස්වාමි වූ ජේසුස් ක්‍රිස්තු කෙරෙහිද විශ්වාස කරමි. මොහු ස්ප්‍රිතු සාන්තු විසින් ගැබ බැස
කන්‍යා මරියතුමියගෙන් උපන්නාහ. පෝන්සියෝ පිලාත්හට යටහත්ව වද විඳ, කුරුසියේ ඇණ
ගැසුම් කා උකුත් වී තැන්පත් කරන ලද්දාහ. පාතාලයට බැස තුන්වෙනිදා මළවුන් කෙරෙන්
උත්ථානකර වදාරා පරමණ්ඩලවලට නැගී සර්ව වල්ලභවූ දෙවිපියාණන්ගේ දකුණු පාර්ශවයෙහි
වැඩ සිටින්නාහ.එහි සිට ජීවතුන්ටත් මළවුන්ටත් නඩු වදාරන්නට වඩින්මය. ස්ප්‍රිතු සාන්තු
කෙරෙහි ද සාධාරණ සාන්ත සභාවෙහිද, සාන්තුවරයන්ගේ සමෝස ධර්මලාභයෙහි ද, පාප
ක්ෂමාවෙහිද, මාංශෝස්ථානයෙහි ද, අනන්ත ජීවිතයද විශ්වාස කරමි. ආමෙන්.

## දයාධික මනස්ථාපය

මාගේ දෙවියනි, මම ඔබ වහන්සේට අනදර කළ නිසා බොහෝ සේ වික්ෂෝප වෙමි.
මාගේ පාපවලින් මා සදාකාල නිරාගින්නට හිමි වූ හෙයින්ද, මාගේ දයාබර ජේසුස් ක්‍රිස්තුස්
ස්වාමිදරුවන් කුරුසියේ ඇණ ගැසූ හෙයින්ද, විශේෂකොට සර්වදයා යහපත්කම් ඇත්තා
වූ ඔබට අනදර කළ හෙයින්ද, සියලු දේට වඩා ඒවාට වෛර කරමි. මා කළ සියලු
පාපවලට මාගේ මුළු හෘදයෙන් ම ක්ෂමාව ඉල්ලමි. ඔබවහන්සේගේ පිහිටෙන් මින් මතු
පවු නොකර සිටින්ටත්, පව් ප්‍රස්ථාවලින් වැළකී සිටින්නටත් ඒකාන්තයෙන්ම පොරොන්දු වෙමි.
ආමෙන්

# සොම්නස් අභිරහස්
## (සඳුදා , සෙනසුරාදා)



### 1. සමිඳාණන් වහන්සේගේ මාංශගත වීම දැනුම් දීම

මරියාවෙනි බිය නොවන්න. ඔබ දෙවියන් වහන්සේගේ වරප්‍රසාද ලද්දෙහිය. මේ බලන්න ඔබ පිළිසිඳගෙන පුතෙකු ලබන්නෙහිය. උන්වහන්සේට ජේසුස් යන නාමය තබන්න.

**ශු.ලූක් 1:30-31**



### 2. මරියතුමී එලිසබෙත් තුමිය බැහැ දැකීම

ඔබ වනිතාවන් අතර අතිශයින් ආශිර්වාද ලද්දේය මාගේ ස්වාමින් වහන්සේගේ මෑණියන් මා වෙත පැමිණීමට තරම් මම කවරෙක්ද?

**ශු.ලූක් 1:42-43**



### 3. ජේසුස් වහන්සේගේ උපත

ඈ කුළුදුල් පුත්‍රයා බිහි කොට රෙදිවලින් ඔතා තානායමෙහි ඉඩකඩ නොතිබුණු බැවින් ගව ඔරුවක තැබුවාය.

**ශු.ලූක් 2:7**



### 4.ජේසුස් වහන්සේ දේව මාළිගාවේ ඔප්පු කරනු ලැබීම

මේ දරුවා ඊශ්‍රායෙල්හි බොහෝ දෙනුකුගේ වැටීම හා නැගිටීම පිණිසත් ප්‍රතික්ෂේපයට ලක්වන දේව සළකුණක් වන පිණිසත් නියමව සිටි.එසේය ඔබේම හදවත කඩුවකින් අනිනු ලැබුවාක් මෙන් තුවාල වනු ඇත. මෙසේ වන්නේ බොහෝ දෙනෙකුගේ සිත්හි රහස් කල්පනා එළිදරව් වන පිණිසය.

**ශු.ලූක් 2:34-35**



### 5. ජේසු කුමරුන් දේව මාළිගාවේදි හමුවීම

උන්වහන්සේ ඔවුන් කැටුව නාසරෙත් නුවරට පැමිණ ඔවුන්ට කීකරු ව විසූ සේක. උන්වහන්සේගේ මෑණියෝ මේ සියල්ලක්ම සිත්හි නිදන් කර ගත්හ. ජේසුස් වහන්සේ ප්‍රඥා මහිමයෙන් හා කාය ශක්තියෙන්ද, දෙවියන් වහන්සේගෙන් හා මිනිසුන්ගෙන් ප්‍රසාදය ලබමින් ද වැඩුණු සේක.

**ශු.ලූක් 2:31-32**

# දුක්ප්‍රාප්තියේ අභිරහස්
## (අඟහරුවාදා , සිකුරාදා)



### 1. ජේසු තුමන්ගේ මල් උයනේ යාච්ඤාව

අබ්බා පියාණෙනි, ඔබට සියල්ලක්ම කළ හැකිය. මේ කුසලානය මා කෙරෙන් ඉවත් කළ මැනව. එහෙත් මාගේ කැමැත්ත නොව ඔබගේ කැමැත්ත ලෙස සිදු වේවා.

**ශු.මාක් 14:36**



### 2. ජේසුස් වහන්සේ ගල් කණුවේ බැඳ කසවලින් තළනු ලැබීම

පිලාත් ජනතාව සතුටු කරන්නට කැමතිව බරබ්බාස් ඔවුන්ට නිදහස් කර දී ජේසුස් වහන්සේ කසයෙන් තලවා කුරුසයෙහි ඇණ ගසනු පිණිස භාර දුන්නේය.

**ශු.මාක් 15:15**



### 3. ජේසුතුමන්ට කටු ඔටුන්නක් පැළඳවීම

සෙබළෝ උන්වහන්සේ නීල රක්ත වස්ත්‍රයක් හඳවා කටු කිරුළක් ගොතා උන් වහන්සේගේ හිස මත තබා යුදෙව්වන්ගේ රජුනි ඔබට සැරදේ කියා උන්වහන්සේට ආචාර කරන්නට පටන් ගත්හ.


**ශු.මාක් 15:17-18**



### 4. ජේසුස් වහන්සේ කුරුසිය කර තබාගෙන කල්වාරියට යෑම

ජුදෙව්වෝ ජේසුස් වහන්සේව භාර ගත්හ. උන්වහන්සේව කුරුසිය උසුලගෙන හෙබ්‍රෙව් නම් ස්ථානට වැඩිය සේක.

**ශු.ජුවාම් 19:17**



### 5. ජේසුස් වහන්සේ කුරුසියෙ ඇණ ගසනු ලැබීම

ජේසුස් වහන්සේ මහ හඬින් මොර ගසා පියාණෙනි ඔබ වහන්සේගේ හස්ත වලට මාගේ ආත්මය භාර දෙමි වදාළ සේක. මෙවදන් කියා උන්වහන්සේ උකුත් වූ සේක.

**ශු.ලූක් 23:46**

# විජග්‍රහණයේ අභිරහස්
## (බදාදා, ඉරිදා)



### 1. ජෙසුස් වහන්සේගේ උත්ථානය
බිය නොවන්න ඔබ කුරුසියෙහි ඇණ ගැසු ජේසුස් වහන්සේ සොයන බව දනිමි. උන් වහන්සේ මෙහි නැත උන්වහන්සේ වදාළ ලෙසම උත්ථාන වූ සේක.

**ශු.මතෙව් 28:5-6**

### 2. ජේසුස් වහන්සේගේ ස්වර්ගාරෝහනය
අපෝස්තුළුවරුන් බලා සිටියදීම උන්වහන්සේ ඔසවා ගනු ලැබ වළාකුලකින් වැසි ඔවුනට නොපෙනී ගිය සේක. ඔබ කෙරෙන් ඔසවා ගනු ලැබු මෙම ජේසුස් වහන්සේ ස්වර්ගයට නගිනු දුටු සේම ආපසු වඩිනු ඇත.

**ක්‍රියා 1:9-11**





### 3. ශුද්ධාත්ම දානය
එකල සැඩ සුලඟක් හමන්නා වැනි හඬක් හදිස්සියෙන් පැමිණියේය. ඔවුහු සියල්ලෝම ශුද්ධාත්මායාණන්ගෙන් පූර්ණ වී ආත්මායණන් ඔවුන්ට දුන් කථා ශක්තිය ලෙස අන්‍ය භාෂාවලින් කතා කරන්නට පටන් ගත්හ.

**ක්‍රියා 2: 2-4**

### 4. කන්‍ය මරියාවන් ස්වර්ගයට ඔසවා ගනු ලැබීම
ජේසුස් වහන්සේ නැසී නැවත් උත්ථාන වූ සේකැයි අපි අදහමු. එසේම උන්වහන්සේ කෙරෙහි විශ්වාස කරමින් පරලෝ සැපත් වූ අය උන්වහ්න්සේ මගින් දෙවියන් වහන්සේව නැවත ගෙනෙන සේකැයි ද අදහමු. මෙසේ අපි නිතරම ස්වාමින් වහන්සේ සමඟ සිටින්නෙමු.

**තෙසලොනික 4:14-17**





### 5. කන්‍ය මරිය තුමිය ස්වර්ගයේත් මෙලොවෙහිත් රැජින ලෙස ඔටුනු පැළඳීම
අහසෙහි පුදුම දර්ශනයක් විය. එනම් සූර්යයා පැළඳගෙන පාද යට සඳමඬල ද හිස මත තාරකා දොළහකින් යුත් කිරුළක් ද ඇති ස්ත්‍රියකි.

**එළිදරව්ව 12:1**

# ආලෝකයේ අභිරහස්
## (බදාදා, ඉරිදා)



### 1. ජේසුස් වහන්සේගේ බව්තිස්ම - ස්නාපනය

ජේසුස් වහන්සේ ජොහාන් විසින් ජෝර්ශාන් ගඟේදී බව්තිස්ම ස්නාපනය කරනු ලැබූ සේක. උන්වහන්සේ දියෙන් ගොඩගැනෙත්ම ස්වර්ගය විවර වී ආත්මයාණන් වහන්සේ පරවියෙකු මෙන් තමන් පිට බැස එනු දුටු සේක. තවද ස්වර්ගයෙන් හඬක් ඔබ මාගේ ප්‍රියාදර පුත්‍රයාණෝය, ඔබ කෙරෙහි මම ඉතා ප්‍රසන්නව සිටිමි යි පැවසීය.

**ශු.මතෙව් 28: 5-6**

### 2. කනා නුවර විවාහ මංගල්‍යයේදි වතුර මිදිරසට හැරවීම



කානා නුවර විවාහ මංගල්‍යයේදි මිදි යුෂ මදි වූ විට ජේසුස් වහන්සේගේ මෑණියෝ මිදි යුෂ නැතැයි උන්වහන්සේට කීහ. ජේසුස් වහන්සේ ස්ත්‍රිය ඔබත් මාත් මේ ගැන කරදර වන්නේකුමටද? මගේ මොහොත තවම පැමිණ නැතැයි වදාළ සේක උන්වහන්සේගේ මෑණියෝ පිළිතුරු දෙමින් මෙතුමාණන් ඔබට කියන කොයි දෙයක් වුවද කරන්නැයි සිය සේවකයන්ට පැවසීය

**ශු.ජුවාම් 2:3-5**



### 3. දේව රාජ්‍යය පිළිබඳ ජේසුස් වහන්සේගේ ප්‍රකාශනය

ජේසුස් වහන්සේ විශාල ජනකාය දැක කන්දකට නැගුණ සේක. උන්වහන්සේ වැඩ සිටි කළ ශ්‍රාවකයෝ උන්වහන්සේ වෙත ආහ. එවිට උන්වහන්සේ ඔවුන්ට උගන්වමින් මෙසේ වදාළ සේක. බැගෑ සිතින් දෙවි සරණ පතන්නෝ භාග්‍යවන්තයෝය. ස්වර්ග රාජ්‍යය ඔවුන්ගේය. ප්‍රීති ප්‍රමෝද වන්න, මන්ද ස්වර්ගයෙහි ඔබගේ පල විපාකය ඉමහත්ය. ඔබට පෙර සිටි දිවැසිවරුන්ටත් ඔවුහු එලෙසම පීඩා කළහ

**ශු.මාක් 15:17-18**

### 4.ජේසුස් වහන්සේගේ අන්‍යරූප විලාශවීම



ජේසුස් වහන්සේ පේදුරු ද ජාකොබ් ද ජොහාන් ද තමන් සමඟ උස් කන්දකට ගෙන ගිය සේක. උන්වහන්සේ ඔවුන් ඉදිරියෙහි අන් වෙසක් වූ සේක. ධවල දීප්තියකින් උන්වහන්සේගේ වස්ත්‍ර බැබළිනි. එවිට එළියාද මෝසෙස් ද ඔවුන්ට දර්ශනය වූහ ඔවුහු ජේසුස් වහන්සේ සමඟ කතා කරමින් සිටියහ. තවද වළාකුලක් නැගී මේ මාගේ ප්‍රියාදර පුත්‍රයාණෝය. ඔහුට සවන් දෙන්නැයි වළාකුළෙන් හඬක් නික්මිනි.

**ශු.ජුවාම් 19:17**



### 5. ජේසුස් වහන්සේ දිව්‍ය සත්ප්‍රසාදය ස්ථාපිත කිරීම

ඔවුන් කෑම කමින් සිටියදී ජේසුස් වහන්සේ රොටි ගෙන ආශිර්වාද කර ඒවා කඩා ශ්‍රාවකයන්ට දී මෙය වළඳන්න. මේ මාගේ ශරීරයයි වදාළ සේක. උන්වහන්සේ කුසලානයද ගෙන තුති පුදා ඔවුන්ට දී ඔබ සියල්ලෝම මෙය පව් කමාව පිණිස බොහෝ දෙනා උදෙසා වගුරුවනු ලබන මාගේ ගිවිසුම් රුධිරය යයි වදාළ සේක.

**ශු.මතෙව් 7:26-28**

# ඔප්පු කිරීම

සකල ගුණ සම්පන්න කරුණාභරිත වූ දේවාමාතාවෙනි. ඔබගේ ශ්‍රී පාද පද්මයට වැඳ නමස්කාර කර මේ ජපමාල ධ්‍යානය ඔබට ඔප්පු කරමු. මෙහිදී අප විභාග කළ කාරණාවල් අපට සිද්ධ කොට දී මෙලොවින් මිදී ගිය කල්හි ඔබ හා ඔබගේ ශ්‍රී කුමාරයාණන් දැක මෝක්ෂ සම්පූර්ණකම ලබන්නට කරුණා කර වදාළ මැනව. ආමෙන්.

# මංගල්‍යය ආරාධනාව

මංගල්‍යස්තු රාජේස්වරියනි, කෲපදයා මාතාවෙනි. අපේ  ජීවිතයෙනි, අපේ අමෘතයෙනි, අපේ ආධාරයෙනි, මංගල්‍යස්තු, පරදේසවාසී වූ අපි ඒව අම්මාගේ පුත්‍රයෝ ඔබටම අඬගසම්හ. මේ කඳුළු විලෙහි අඬා වැළපී ඔබටම සුසුම්ලම්හ. එසේ හෙයින් අපගේ මධ්‍යස්ථයෙනි මේ ඔබගේ දයාබර නේත්‍රවල් අප දෙස යොමු කළ මැනව. තවද පරදේශය පසුවූ ඉක්බිති ඔබගේ ශ්‍රී කුසෙහි ආශිර්වාදලත් ඵලවන් ජේසුතුමන්ගේ දර්ශනය අපට ලබා දුන මැනව. දයාවන්තියෙනි, පරළුක්ඛ ළුක්ඛිතිනි, මධුරවූ නිත්‍යා කන්‍ය මරියනි, සාන්ත වූ දේව මෑණියෙනි, ක්‍රිස්තු තුමන්ගේ වාක්දාත වලට අප හේතුවන්ත වන පිණිස. කන්‍යා ශුද්ධවූ දේව මාතාවෙනි අප නිසා යාච්ඤා කළ මැනව.



# දේවමාතා ප්‍රාර්ථනාව

ස්වාමිනී කරුණා කළ මැනව //
ක්‍රිස්තුනී කරුණා කළ මැනව //
ස්වාමිනී කරුණා කළ මැනව //
ක්‍රිස්තුනී අපේ ප්‍රාර්ථනා අසා වදාළ මැනව //
ක්‍රිස්තුනී අපේ ප්‍රාර්ථනා ගිවිස වදාළ මැනව //

**අපට දයා කළ මැනව**

පරමණ්ඩලවල වැඩ ඉඳින පිතාවන දෙවියනී
ලෝකය නිදහස් කළා වූ පුත්‍රවන දෙවියනී
ස්ප්‍රීතු සාන්තු වන දෙවියනී
සුපරිශුද්ධ ත්‍රිත්වය වූ ඒක දෙවියනී

**අප නිසා යාච්ඤා කළ මැනව**

ශුද්ධවූ මරියනි
ශුද්ධවූ දේවමෑණියනි
කන්‍යාති කන්‍යාවෙනි
ක්‍රිස්තෝත්තමයාගේ මාතාවෙනී
දේව ප්‍රසාද මාතාවෙනී
අති සුවිශුද්ධ වූ මාතාවෙනී
අති වෘථවූ මාතාවෙනී
කන්‍යාවෘත අභිනවූ මාතාවෙනී
ප්‍රේමනීය වූ මාතාවෙනී
ආශ්චර්ය යුක්තවූ මාතාවෙනී
යහපත් අනුශාසනා දායකවූ මාතාවෙනී
ශ්‍රේෂ්ඨ ඇඳුරාගේ මාතාවෙනී
රක්ෂාධිකාරහුගේ මාතාවෙනී
විශාරද බුධ්‍යාග්‍රවූ කන්‍යාවෙනි
වන්දනීයවූ කන්‍යාවෙනි
ප්‍රශංසනීයවූ කන්‍යාවෙනි
ශක්තිධාරීවූ කන්‍යාවෙනි
දයාබරිතවූ කන්‍යාවෙනි
විශ්වාසපක්ෂ වූ කන්‍යාවෙනි
ධර්මනීති දර්පණෙනී
පරමඥාන ආසනෙනි
අපේ ආනන්ද කාරණාවෙනි
ඥාන පාත්‍රෙනි
අග්‍රාචාර යුක්තවූ පාත්‍රෙනි
අනර්ඝවූ භක්ති පාත්‍රෙනි
දිව්‍යා අභිරහස් විෂයක පද්මයෙනි
දාවිත් රාජේන්ද්‍ර කීලෙනි
දන්තමය ගෝපුරෙනි
ස්වර්ණමය මන්දිරෙනි
වාක්ප්‍රසාද ගැබයෙනි
පරමණ්ඩල වාසලෙනි
උදය තාරකාවෙනි
රෝගීන්ගේ ආරෝග්‍යයෙනි
පව්කාරයන්ගේ අඩක්කලමෙනි
වික්ෂිප්තයින්ගේ සැනසීමෙනි
ක්‍රිස්තියානින්ගේ පිහිටෙනි
සුරතාවයින්ගේ රාජේශ්වරිනි
ආදිපිතරුවන්ගේ රාජේශ්වරිනි
දිවස්ප්‍රසාදින්ගේ රාජේශ්වරිනි
වේද සාක්ෂිවරයන්ගේ රාජේශ්වරිනි
අපෝස්තුළුවරයන්ගේ රාජේශ්වරිනි
වන්දනාවාදීන්ගේ රාජේශ්වරිනි
කන්‍යාවන්ගේ රාජේශ්වරිනි
සමස්ත ශුද්ධවන්තයන්ගේ රාජේශ්වරිනි
ජන්මදෝෂ රහිතව පිළිසිඳුනාවූ රාජේශ්වරිනි
ස්වර්ගාරෝපිත රාජේශ්වරිනි
ශුද්ධවූ ජපමාල රාජේශ්වරිනි
සමාදානයේ රාජේශ්වරිනි

ලෝක පාපවල් හරින දේවාජබාලකවූ ජේසුනි - **අපට ක්ෂමා කළ මැනව ස්වාමිනී**
ලෝක පාපවල් හරින දේවාජබාලකවූ ජේසුනි - **අපේ ප්‍රාර්ථනා අසා වදාළ මැනව ස්වාමිනී**
ලෝක පාපවල් හරින දේවාජබාලකවූ ජේසුනි - **අපට දයා කළ මැනව ස්වාමිනී**

ක්‍රිස්තු තුමන්ගේ වාක්දාත වලට අප හේතුවන්ත වන පිණිස.
**කන්‍යා ශුද්ධවූ දේව මාතාවෙනි අප නිසා යාච්ඤා කළ මැනව.**

**යාච්ඤා කරම්හ**

සර්ව බලධාරිවූ අනාදි අනන්ත වූ දෙවියනි. මෝක්ෂම්පන්න මාතාවන කන්‍යා මරියතුමන්ගේ ගත හා ප්‍රාණය ඔබගේ ශ්‍රී කුමාරයාට ඔබින වාසස්ථානය වන ලෙස ස්ප්‍රීතු සාන්තු වරමින් හේතු යුක්ත කර දී වදාළ වේද, අප සතුටුව සිහි කරන ඕතුමන්ගේ දයාබර යාච්ඤාව බලා අපට යෙදෙන්නාවූ නපුරු වලින් හා අනවර්ථ මරණයෙන් ගැළවීම සැලසුව මැනව.

මේකීදේ අපගේ ස්වාමි වූ ජේසුස් ක්‍රිස්තු උදෙසාම ලැබේවා.

# ආමෙන්